**අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ) උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2013**

**පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රය.**

**ගිණුම්කරණය I** **කාලය-පැය දෙකයි**

***සකස් කිරීම :- අධ්‍යාපන අමාත්‍යංශයේ වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාවේ මෙහෙයවීමෙන් සියලුම හිමිකම් ඇවිරිණි***

---

**1.** මූල්‍ය ප්‍රකාශනවල තිබිය යුතු ගුණාත්මක ලක්ෂණ වන්නේ

(1) උපචිත බව, අදාළ බව, විශ්වසනීය බව හා අපක්ෂපාතී බව යි.
(2) අදාළ බව , විශ්වසනීය බව , අපක්ෂපාතී බව හා සංගතතාව යි.
(3) කාලානුරූපී බව , සැසඳිය හැකි බව, විශ්වසනීය බව හා සංගතතාව යි.
(4) අදාළ බව , විශ්වසනීය බව , සැසඳිය හැකි බව හා අවබෝධකරගත හැකි බව යි.
(5) අවබෝධකරගත හැකි බව , කාලානුරූපී බව , අදාළ බව හා සැසඳිය හැකි බව යි.

**2.** මුළු විස්තීරණ ආදායම ගණනය කිරීම සඳහා යොදාගත හැකි නිවැරදි සමීකරණය කුමක් ද?

(1) අවසාන හිමිකම + ආරම්භක හිමිකම – ලාභාංශ – ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වැඩිවීම.
(2) අවසානහිමිකම– ආරම්භක හිමිකම + ලාභාංශ – ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වැඩිවීම.
(3) ආරම්භක හිමිකම– අවසාන හිමිකම– ලාභාංශ + ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වැඩිවීම.
(4) ආරම්භක හිමිකම– අවසාන හිමිකම + ලාභාංශ + ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වැඩිවීම.
(5) අවසාන හිමිකම– ආරම්භක හිමිකම– ලාභාංශ + ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වැඩිවීම.

**3.** පවිත්‍රා ව්‍යාපාරයේ 2013.01.02 සිට 2013.01.05 දක්වා සිදුවූ ගනුදෙනුවල බලපෑම මූලික ගිණුම්කරණ සමීකරණයෙන් පහත පරිදි දක්වා ඇත.

| දිනය | වත්කම් (රු) | හිමිකම් (රු) | වගකීම් (රු) |
|---|---|---|---|
| 2013.01.01 ශේෂය | 500 000 | 350 000 | 150 000 |
| 2013.01.02 ගනුදෙනු 1 | -75 000<br>60 000 | <br>-15 000 | |
| 2013.01.03 ගනුදෙනු 2 | -8 000 | -12 000 | 4 000 |
| 2013.01.04 ගනුදෙනු 3 | | 9 000 | -9 000 |
| 2013.01.05 ගනුදෙනු 4 | -18 000 | 2 000 | -20 000 |

2013.01.04 දින සිදුවූ ගනුදෙනුව ආදායම් ප්‍රකාශයට බලපෑමක් නොකරයි.2013.01.02 සිට 2013.01.05 දක්වා සිදු වූ ගනුදෙනු අවසානයේදී ඉපයූ ශුද්ධ ලාභය හෝ ශුද්ධ අලාභය හා හිමිකම කොපමණද?

| | ඉපයූ ශුද්ධ ලාභය/ අලාභය(රු) | හිමිකම (රු) |
|---|---|---|
| (1) | -25 000 | 334 000 |
| (2) | 16 000 | 334 000 |
| (3) | -25 000 | 464 000 |
| (4) | -16 000 | 464 000 |
| (5) | 25 000 | 325 000 |

**4.** විකුණුම්, ආපසු එවුම්, කලින් ලද ගොඩනැගිලි කුලී, බැංකුවේ ඇති මුදල් යන එක් එක් ගිණුම් පිළිවෙලින් වර්ග කල හැක්කේ

(1) ආදායම් ,වත්කම් ,වගකීම් ,වගකීම් ලෙස ය.
(2) වත්කම්,ආදායම් ,ආදායම් ,වගකීම් ලෙස ය.
(3) ආදායම් , වත්කම් ,වගකීම් , වත්කම් ලෙස ය.
(4) ආදායම් , ආදායම් , වත්කම් , වගකීම් ලෙස ය.
(5) ආදායම් , ආදායම්, වගකීම් , වත්කම් ලෙස ය.

**5**සහ **6** ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු උපයෝගී කර ගන්න.
වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ජයමල් රු **300 000** ක් වටිනා භාණ්ඩ 20% වෙළෙඳ වට්ටමකට යටත්ව ණයට ගන්නා ලදී. පසුව මුදල් ගෙවීමේදී 10% ක මුදල් වට්ටමක්ද හිමිවිය.

**5**. ඉහත ගනුදෙනුවට අදාළ ගැනුම් ගිණුමේ සටහන් කළ යුතු වටිනාකම කොපමණ ද?

(1) රු 135 000
(2) රු 216 000
(3) රු 240 000
(4) රු 260 000
(5) රු 270 000

**6**. ඉහත ගනුදෙනුවට අදාළව ලද වට්ටම් ගිණුමේ සටහන් කළ යුතු වටිනාකම කුමක් ද?

(1) රු 12 000
(2) රු 24 000
(3) රු 28 000
(4) රු 30 000
(5) රු 60 000

**7.** ජයන්ත විසින් සුසන්තට භාණ්ඩ තොගය ණයට විකුණන ලදී. එම භාණ්ඩවලින් කොටසක් තමා ඉල්ලුම් කරන ලද අවශ්‍යතා සමඟ නොගැළපෙන බැවින් නැවත ජයන්තට ආපසු එවන ලද අතර ජයන්ත එම ආපසු එවීම පිළිගන්නා ලදී.වෙළඳ ණය පියවීම සඳහා සුසන්ත ජයන්තට චෙක් පතක් ලබාදී ඇත. මෙම ගනුදෙනු ජයන්තගේ පොත්වල සටහන් කිරීමට අදාළ ප්‍රභව ලියවිලි අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) ඉන්වොයිසිය ,බැරපත සහ ලදුපත.
(2) ලදුපත ,බැරපත සහ චෙක් පිළිපත.
(3) ඉන්වොයිසිය ,බැරපත සහ වවුචරය.
(4) ඉන්වොයිසිය ,හරපත සහ ගෙවීම් වවුචරය.
(5) භාණ්ඩ ලැබීම් තුණ්ඩුව ,හරපත සහ ගෙවීම් වවුචරය.

**8.** "විමුක්ති" ව්‍යාපාරයේ අග්‍රිම ක්‍රමයේ සුළු මුදල් පොතට අනුව පහත තොරතුරු ඉදිරිපත් කර ඇත. ඒ ඒ මාසයේ වියදම ඊළඟ මාසයේ පළමු දින ප්‍රතිපූරණය කිරීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තියයි.
2013.03.01 දිනට සුළු මුදල් පොතේ ශේෂය රු. 450
2013.03.01 දිනට සුළු මුදල් ප්‍රතිපූරණ ලැබීම් රු 2550

| | ගමන් ගාස්තු (රු) | ලිපි ද්‍රව්‍ය වියදම් (රු) | තැපැල් ගාස්තු (රු) | විවිධ (රු) |
|---|---|---|---|---|
| 2013 මාර්තු මාසය | 420 | 560 | 250 | 1300 |
| 2013 අප්‍රේල් මාසය | 580 | 700 | 190 | 1375 |

**2013.03.31** දිනට සුළු මුදල් පොතේ ශේෂය හා **2013.05.01** දිනට සුළු වියදම් ප්‍රතිපූරණය කළ මුදල අනුපිළිවෙළින්

| | 2013.03.31 දිනට <u>සුළු මුදල් පොතේ ශේෂය</u>(රු) | | 2013.05.01 දිනට <u>ප්‍රතිපූරණය කළ මුදල</u>(රු) | |
|---|---|---|---|---|
| (1) | 155 | සහ | 2 530 | ය. |
| (2) | 155 | සහ | 2 845 | ය. |
| (3) | 470 | සහ | 2 530 | ය. |
| (4) | 470 | සහ | 2 845 | ය. |
| (5) | 625 | සහ | 5 375 | ය. |

9 හා 10ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගත යුතුවේ.
ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කර අලෙවි කරන ව්‍යාපාරයක. 2013.03.31න් අවසන් වූ **කාර්තුවට** අදාළ තොරතුරු පහත දැක්වේ.

| | රු |
|---|---|
| දැව මිලදී ගැනීම් | 225 000 |
| විදුලිය හා බලය | 30 000 |
| කම්හල් යන්ත්‍ර (පිරිවැය) | 120 000 |
| දැව ගෙන ඒමේ කුලිය | 40 000 |
| කම්හල් කුලිය | 18 000 |
| 2013.03.31 දැව තොගය | 65 000 |
| වඩු කාර්මික වැටුප | 349 000 |

- යන්ත්‍ර සූත්‍ර සඳහා වාර්ෂික ක්ෂය වීම පිරිවැය මත 10% කි.
- කාලසීමාව තුළදී මේස 200ක් නිපදවා 150 ක් විකුණා ඇත.

**9**. 2013.03.31 දිනට තොගයේ ඇතුළත් කළයුතු පරිවර්තන පිරිවැය කොපමණද?

(1) රු 100 000
(2) රු 200 000
(3) රු 300 000
(4) රු 400 000
(5) රු 600 000

**10.** 2013.03.31 දිනට තොග පිරිවැය කොපමණද?

(1) රු 100 000
(2) රු 150 000
(3) රු 200 000
(4) රු 300 000
(5) රු 600 000

**11.** ව්‍යාපාරයක් 2008.04.01 රු 80 000කට යන්ත්‍රයක් මිලදී ගත් අතර එය වාර්ෂිකව 10% බැගින් ක්ෂය ප්‍රතිපාදනය කරන ලදී. මෙම යන්ත්‍රයේ ජීවිත කාලය 2011.04.01 සමාලෝචනය කරන ලද අතර යන්ත්‍රයේ එදිනට ජීවිත කාලය අවුරුදු 04ක් බව ඇස්තමේන්තු කරන ලදී. ඒ අනුව 2011/2012 වර්ෂය සඳහා ක්ෂය වනුයේ

(1) රු 8 000කි.
(2) රු 14 000කි.
(3) රු 16 000කි.
(4) රු 24 000කි.
(5) රු 32 000කි.

**12.** ලයන් සමාගම ජපානයෙන් කුලුබඩු පැකට් කිරීමේ යන්ත්‍රයක් මිල දී ගත් අතර ඊට අදාළ වියදම් පහත පරිදි විය.

| | | රු |
|---|---|---|
| යන්ත්‍රය ගැනුම් මිල | | 400 000 |
| තීරුබදු | | 22 000 |
| ප්‍රවාහන වියදම- | නැව් | 36 000 |
| - | ලොරි | 16 000 |
| සවිකිරීම සඳහා | | 12 000 |
| නඩත්තු කටයුතු සඳහා දිනකට | | 10 000 |

මෙම යන්ත්‍රය නිසි ලෙස සවි නොකිරීම හේතුවෙන් එය නැවත සවි කිරීම සඳහා රු 8 000 ක් දරණ ලද අතර වැරදි ලෙස සවි කිරීම හේතුවෙන් ඇතිවූ නිෂ්පාදන පාඩුව (පළුදු වූ භාණ්ඩවල වටිනාකම) රු 25 000කි.
මේ අනුව යන්ත්‍රයේ පිරිවැය වනුයේ

(1) රු 422 000කි.
(2) රු 434 000කි.
(3) රු 486 000කි.
(4) රු 492 000කි.
(5) රු 519 000කි.

**13**. ණයහිමි පාලන ගිණුමේ ශේෂය සමග ණයහිමි ශේෂ ලැයිස්තුව සැසඳීමේදී එම ශේෂයන් අතර වෙනසක් පෙන්නුම් විය. මෙහිදි පහත වැරදි අනාවරණය විය.

- ණයහිමි ගෙවීම් රු 4 000ක් වැඩියෙන් ලෙජරයේ ගිණුම් ගත කර ඇත.
- ණය හිමියකුගේ පෞද්ගලික ගිණුමක ශේෂය වූ රු 1 000ක් ණයහිමි ශේෂ ලැයිස්තුවෙන් මගහැරී ඇත.

මේවා නිවැරදි කළ යුත්තේ පහත ගැළපිලි අතරින් කවරකින්ද?

| | ණයහිමි පාලන ගිණුම | මුදල් ගිණුම | ණයහිමි ශේෂ ලැයිස්තුව |
|---|---|---|---|
| (1) | රු 4 000ක් හර කිරීම | රු 4 000 ක් බැර කිරීම. | රු 1000 ක් එකතු කිරීම. |
| (2) | රු 4 000ක් බැර කිරීමරු | රු 4 000ක් හර කිරීම. | රු 1000ක් අඩු කිරීම. |
| (3) | රු 4 000ක් බැර කිරීමරු | රු 4 000ක් හර කිරීම. | රු 1000ක් එකතු කිරීම. |
| (4) | රු 4 000ක් බැර කිරීමරු | රු 4 000ක් බැර කිරීම. | රු 1000ක් අඩු කිරීම. |
| (5) | රු 4 000ක් බැර කිරීමරු | රු 4 000ක් හර කිරීම. | වෙනසක් නොවේ. |

**14.** 2013.01.01දින රු 400 000 මුදල් හා රු 200 000 පෞද්ගලික ගොඩනැගිල්ල යොදා ගනිමින් කනිෂ්කා වෙළඳ ව්‍යාපාරයක් ඇරඹීය.2013.03.31න් අවසන් වූ කාර්තුව තුළ දී මාසයකට රු 5 000 බැගින් පෞද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයේ මුදල් ගෙන ඇති අතර කාර්තුව සඳහා රු 8 000 ආදායම් බදු ද ව්‍යාපාරයේ මුදල්වලින් ගෙවා තිබිණි. තවද ලොතරැයි දිනුමකින් ලැබූ රු 50 000 න් රු 40 000 ක් ව්‍යාපාරික කටයුතු සඳහා යොදවා ඇත.

2013.03.31 දිනට ප්‍රාග්ධනය රු 675 000 කි.

2013.03.31න් අවසන් කාර්තුව තුළදී ව්‍යාපාරය ඉපැයූ ශුද්ධ ලාභය හෝ ශුද්ධ අලාභය වන්නේ.

(1) රු 48 000ක ශුද්ධ ලාභයකි.
(2) රු 58 000ක ශුද්ධ ලාභයකි.
(3) රු 75 000ක ශුද්ධ ලාභයකි.
(4) රු 92 000ක ශුද්ධ ලාභයකි.
(5) රු 92 000ක ශුද්ධ අලාභයකි.

**15.** සහන් අබේනායක පාලන ගිණුම් පවත්වා ගනිමින් පොදු ලෙජරය පිළියෙල කර ශේෂ පිරික්සුම සකස් කර ඇත. ශේෂ පිරික්සුම අසමාන වූ අතර පොත් පරීක්ෂාවේදී පහත සඳහන් වැරදි හා අඩුපාඩු අනාවරණය වී ඇත.

**(I)** ගැනුම් ජ'නලයේ එකතුව රු 1 000 අඩුවෙන් එකතුවී තිබීම.
**(II)** රු 4 500 ක කඩකුලී ලැබීම් මුදල් පොතේ නිවැරදිව සටහන් කර කඩකුලී වියදම් ලෙසට ගිණුම්ගත කර තිබීම.
**(III)** ණයගැතියන්ගෙන් ලැබී බැංකුවේ තැන්පත් කළ රු8 600ක චෙක්පත අගරු වීම. බැංකු ගිණුමේ නිවැරදිව සටහන් කර ණයගැති පාලන ගිණුමේ වැරදි පැත්තේ රු 6 800ක් ලෙසට පිටපත් කර තිබීම.

ඉහත සඳහන් වැරදි හා අඩුපාඩු තිබියදී පිළියෙල කළ ශේෂ පිරික්සුමේ පැවති වෙනස අවිනිශ්චිත ගිණුමට පිටපත් කලේ නම්, එම අවිනිශ්චිත ගිණුමේ පැවති ශේෂය

(1) රු 2 300ක හර ශේෂයකි.
(2) රු 3 200ක බැර ශේෂයකි
(3) රු 6 400ක හර ශේෂයකි.
(4) රු 6 400ක බැර ශේෂයකි.
(5) රු 7 400ක හර ශේෂයකි.

**16** දිනුම් ක්‍රීඩා සමාජයේ 2012.04.01 දිනට ශේෂයන් පහත දැක්වේ.

| | රු | | රු |
|---|---|---|---|
| හිඟ සාමාජික මුදල | 9 000 | ගොඩනැගිලි අරමුදල | 120 000 |
| මුදල් | 41 000 | සමුච්චිත අරමුදල | 230 000 |
| ගොඩනැගිලි | 200 000 | | |
| | 350 000 | | 350 000 |

2012.04.15 දින ගොඩනැගිලි අරමුදලෙන් රු 80 000 වැයකර ගොඩනැගිලි කොටසක් ඉදි කළ අතර ඊට අදාල ගැළපීම් සිදුකිරීමෙන් පසු වත්කම් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

| | සමුච්ජිත අරමුදල | ගොඩනැගිලි අරමුදල | ගොඩනැගිලි | මුදල් |
|---|---|---|---|---|
| (1) | **230 000** | **40 000** | **200 000** | **221 000** |
| (2) | **230 000** | **40 000** | **280 000** | **121 000** |
| (3) | **230 000** | **120 000** | **200 000** | **141 000** |
| (4) | **230 000** | **280 000** | **80 000** | **140 000** |
| (5) | **310 000** | **40 000** | **280 000** | **61 000** |

**17.** සම සමව ලාභ බෙදාගත් ලීලා, නීලා විසින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට **2010** සැප් **30** දින **1/3** ලාභ කොටසකට හා රු **20 000** ක මාසික වේතනයකට එකඟව මාලා හවුල් ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී. **2011** මාර්තු **31** දිනෙන් අවසන් වර්ෂය තුළදී ඒකාකාරී ලෙස උපයන ලද ශුද්ධ ලාභය රු **1 200 000**ක් විය. **2011.03.31** දිනෙන් අවසන් වසර සඳහා ලීලා හා මාලා හවුල් ව්‍යාපාරයෙන් ලබා ගත් ආදායම් වනුයේ

| | ලීලා(රු) | | මාලා(රු) |
|---|---|---|---|
| (1) | **160 000** | හා | **200 000** ය. |
| (2) | **300 000** | හා | **160 000** ය. |
| (3) | **360 000** | හා | **460 000** ය. |
| (4) | **460 000** | හා | **160 000** ය. |
| (5) | **460 000** | හා | **280 000** ය. |

**18.** අනිඳු,ජනිඳු දෙදෙනා AJ ව්‍යාපාරය නමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර එහි තොරතුරු පහත දැක්වේ. වාර්ෂික ප්‍රාග්ධන පොලිය 12%ක් සහ මාසික වැටුප් රුපියල් 10 000 බැගිනි. ලාභාලාභ අනුපාතය පිළිවෙලින් **3 : 2** වේ. 2012 අප්‍රේල් මාසයේ ලාභය රු **100 000** කි. අනෙකුත් තොරතුරු

| | අනිඳු (රු) | ජනිඳු (රු) |
|---|---|---|
| 2012.04.01 දිනට ප්‍රාග්ධන ගිණුම් | 400 000 | 600 000 |
| 2012.04.01 දිනට ජංගම ගිණුම් | 40 000(බැර) | 10 000 (හර) |
| 2012 අප්‍රේල් මාසය තුළ ගැනිලි | 8 000 | 2 000 |

ඉහත තොරතුරු අනුව අප්‍රේල් මාසය අවසානයේ අනිඳු හා ජනිඳු ගේ ජංගම ශේෂ නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

| | අනිඳු (රු) | ජනිඳු (රු) |
|---|---|---|
| (1) | **32 000** (බැර) | **88 000** (බැර) |
| (2) | **42 000** (බැර) | **28 000** බැර) |
| (3) | **54 000** (බැර) | **26 000** (බැර) |
| (4) | **80 000** (බැර) | **30 000** (බැර) |
| (5) | **88 000** (බැර) | **32 000** (බැර) |

**19.** හංසලී සහ අනිපා හවුල්කරුවන්ය.ණය පොලී අඩු කිරීමට පෙර **2013.06.30**න් අවසන් වූ අර්ධ වර්ෂයේ ශුද්ධ ලාභය රු.**83 000** කි.පහත තොරතුරු ද පවතී.

| 2013.01.01 දිනට | හංසලී (රු) | අනිපා(රු) |
|---|---|---|
| මුළු හිමිකම් | 670 000 | 450 000 |
| ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | 600 000 | 500 000 |
| ණය මුදල(බැර) | | 120 000 |
| ගැනිලි | 20 000 | 16 000 |

ණය පොලී උපචිතව ඇත.

ඉහත තොරතුරුවලට අනුව **2013.06.30** දිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්වල ශේෂයන් වන්නේ

| | හංසලී (රු) | අනිපා(රු) |
|---|---|---|
| (1) | **70 000** | **(50 000)** හර ය. |
| (2) | **90 000** | **(23 000)** හර ය. |
| (3) | **110 000** | **(10 000)** හර ය. |
| (4) | **110 000** | **(26 000)** හර ය. |
| (5) | **640 000** | **460 000** ය. |

**20.** සීමිත සමාගමක ගිණුම් වර්ෂයක් අවසාන වන දිනය වන විටත් පැවති එක්තරා සිදුවීමක් සම්බන්ධව පහත සඳහන් ලක්ෂණ ඇත.

A. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් ඇත.

B. එය නිරාකරණය කිරීමට වත්කම් පිටතට ගලායාමේ සම්භාව්‍යතාවක් ඇත.

C. බැඳීමේ ප්‍රමාණය සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ හැකිය.

ඉහත සිදුවීම හඳුනා ගන්නේ කුමන ආකාරයෙන් ද?

(1) වගකීමක් ලෙස ය.
(2) ප්‍රතිපාදනයක් ලෙස ය.
(3) ඇස්තමේන්තුවක් ලෙස ය.
(4) සම්මුතික බැඳීමක් ලෙස ය.
(5) අසම්භව්‍ය බැරකමක් ලෙස ය.

**21.** කල්බදු සම්බන්ධයෙන් ප්‍රකාශන කිහිපයක් පහත දැක්වේ

A. අවදානම් හා ප්‍රතිලාභ බදු ගැනුම්කරුට හිමිවේ.
B. බදු කාලය අවසානයේ වත්කමේ අයිතිය බදු ගැනුම්කරුට මාරු විය හැකිය.
C. වත්කමේ ආර්ථික ජීවිත කාලයට කල්බදු කාලය බෙහෙවින් සමාන විය හැකිය.

මූල්‍ය කල්බද්දක් යන්න තීර්ණය කිරීමට දායක වන ප්‍රකාශය හෝ ප්‍රකාශයන් වනුයේ

(1) A පමණි.
(2) B පමණි.
(3) A සහB පමණි.
(4) B , සහ C පමණි.
(5) A, B , සහ C යන සියල්ලම වේ.

**22.** සමාගමක් තම යන්ත්‍ර ක්ෂය කිරීමේ ක්‍රමය ලෙස මෙතෙක් භාවිත කරනු ලැබූ හීනවන ශේෂ ක්‍රමය **2013.03.31** දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සරල මාර්ග ක්‍රමයට වෙනස් කර ඇත.
ඉහත වෙනස් වීම සම්බන්ධව අනුගමනය කළ යුතු ගිණුම්කරණ ක්‍රමය වන්නේ

(1) අතීතානුයෝගී ලෙස නැවත ප්‍රකාශ කිරීමයි.
(2) අතීතානුයෝගී ව්‍යවහාරය අනුව ගිණුම් තැබීමයි.
(3) ඉදිරි වර්ෂවලට පමණක් බලපාන පරිදි ගිණුම් තැබීමයි.
(4) ප්‍රවර්ථන හා පෙර වර්ෂවලට ඇති වූ බලපෑම හෙළිදරව් කිරීමයි.
(5) ප්‍රවර්ථන වර්ෂයට හා ඉදිරි වර්ෂවලට බලපාන පරිදි ගිණුම් තැබීමයි.

**23.** ප්‍රසාද නිකුතුව සම්බන්ධව ප්‍රකාශ කිහිපයක් පහත දී ඇත.

A. කොටස්කරුවන්ගේ හිමිකම වැඩිවේ
B. මූල්‍ය තත්වයේ වෙනසක් සිදු නොවේ.
C. මුදල් ප්‍රවාහ ව්‍යාපාරයට ගලා ගෙන එයි.

ඉහත වගන්තිවලින් නිවැරදි වගන්තිය/වගන්ති වන්නේ.

(1) A පමණි.
(2) B පමණි.
(3) Cපමණි.
(4) A සහ B පමණි.
(5) A, B , සහ C යන සියල්ලම වේ.

**24.** සීමිත සමාගමක **2013.03.31** දිනෙන් අවසන් වූ වර්ෂයට අදාළ ලාභාංශ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| A. ගෙවූ ලාභාංශ | - | සාමාන්‍ය කොටස් | රු **300 000** |
| | | වරණීය කොටස් | රු **150 000** |

B. වරණීය කොටස් සඳහා වර්ෂයකට අදාළ මුළු ලාභාංශ ප්‍රමාණය රු **200 000** කි.

C. සාමාන්‍ය කොටස් සඳහා රු **100 000** ක අවසාන ලාභාංශයක් හා වරණීය කොටස් සඳහා ඉතිරි ලාභාංශ ගෙවීමටත් යෝජනා සම්මත වී ඇත.

මූල්‍ය ප්‍රකාශවල ලාභාංශ දැක්වෙන නිවැරදි ආකාරය කුමක්ද?

| | හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය (රු) | ශේෂ පත්‍රයේ ජංගම වගකීම් (රු) |
|---|---|---|
| (1) | 450 000 | 50 000 |
| (2) | 450 000 | 150 000 |
| (3) | 500 000 | 50 000 |
| (4) | 500 000 | 150 000 |
| (5) | 600 000 | 150 000 |

**25**. රුපියලක විකුණුම් අගයෙන් කොපමණ ප්‍රමාණයක් කොටස් හිමියන්ගේ ලාභය සඳහා හිමි වන්නේද? යන්න මෙම අනුපාතයෙන් ගණනය කළ හැකි වේ.

(1) දළ ලාභ අනුපාතය.
(2) ශුද්ධ ලාභ අනුපාතය.
(3) වත්කම් පිරිවැටුම් අනුපාතය.
(4) හිමිකමට ප්‍රතිලාභ අනුපාතය.
(5) මුළු වත්කම්වලට ප්‍රතිලාභ අනුපාතය.

**26**. මූල්‍ය ස්ථාවරත්ව අනුපාත අනුව මූල්‍ය වාර්තා අර්ථකථනය කිරීම් කිහිපයක් පහත වේ.

A- ව්‍යාපාරයේ මුලු ප්‍රාග්ධනයෙන් ණය ප්‍රාග්ධනය කොපමණ ප්‍රතිශතයක්ද යන්න ණය අනුපාතය මගින් ගණනය කරයි.
B- ව්‍යාපාරයක හිමිකම් ප්‍රාග්ධනය ණය ප්‍රාග්ධනයට වඩා වැඩි වීම අධිතෝලන තත්වයකි.
C- පොලී ආවරණ අනුපාතය අඩු අගයක් ගනී නම් ණය හිමියන්ගේ සුරක්ෂිත බව තහවුරු වේ.

නිවැරදි අර්ථ නිරූපණයක් සිදු වන්නේකුමන ප්‍රකාශනය/ප්‍රකාශනයෙන් ද?
(1) A පමණි.
(2) B පමණි.
(3) A හා B පමණි.
(4) A හා C පමණි.
(5) B හා C පමණි.

**27**. සේවකයන් **පිරිසකගේ** කාර්යයන් සඳහා ගත කළ කාලය සහ එම කාර්යයන්ට අදාළ වූ පිරිවැය සටහන් වන මූලාශ්‍ර ලේඛනය වන්නේ
(1) දෛනික කාල පත්‍රය යි.
(2) කාර්ය තුන්ඩුව යි.
(3) කාර්ය පත්‍රිකාව යි.
(4) කැලි වැඩ තුන්ඩුව යි.
(5) අක්‍රිය කාල පත්‍රය යි.

**28**. සමාගමක් තම නිෂ්පාදන සඳහා RG නැමති ද්‍රව්‍ය මිලට ගනී. ගිණුම් වර්ෂයේ මුල් මාස 6 තුළ දී මාසයකට ඒකක 500ක්. රු 50 බැගින් මිලට ගෙන ඇත. පසුව එළඹි සෑම මාසයකදීම ද්‍රව්‍ය මිල රු 5බැගින් ඉහළ යාම් සහිතව අදාළද්‍රව්‍ය ඒකක 500 බැගින් මිලට ගෙන ඇත.
සෑම මාසයකදීම නිෂ්පාදනය සඳහා ද්‍රව්‍ය ඒකක 400 බැගින් නිකුත් කිරීම සිදුවී ඇත. සමාගම තොග නිකුත් කිරීම සිදු කරනු ලබන්නේ පෙර ඇතුළු පෙර පිට ක්‍රමයට වේ.

වර්ෂය අවසානයේදී ගබඩාවෙහි ඉතිරි තොගයේ වටිනාකම කොපමණද?
(1) රු 60 000කි.
(2) රු 66 500කි.
(3) රු 70 500කි.
(4) රු 91 500කි.
(5) රු 96 000කි.

**29**. ව්‍යාපාරයක විවිධ නිෂ්පාදන හා සේවා අංශ විසින් තම අංශයන්ට අවශ්‍ය ද්‍රව්‍ය ගබඩාවෙන් ඉල්ලුම් කිරීම සඳහා පිළියෙල කරනුයේ
(1) මිල විමසුම යි.
(2) ඉන්වොයිසිය යි.
(3) ගැනුම් ඇනවුම් පත්‍රය යි.
(4) ද්‍රව්‍ය අධියාචනා පත්‍රය යි.
(5) ගැනුම් අධියාචනා පත්‍රය යි.

**30**. නාමල් තම නිෂ්පාදන ආයතනයේ සේවකයන් දෙදෙනා සඳහා නිමැවුම් පදනම මත වැටුප් ගෙවීම කරයි. X හා Y සේවකයන්ට අදාළ තොරතුරු පහත වේ.

- සේවකයකු පැය 8කදි නිපදවිය යුතු ඒකක ගණන 50කි.
- එක් ඒකකයක් සඳහා ගෙවීම රු 20කි.
- නිෂ්පාදන ඉලක්කයඉක්මවන ඒකකයක් සඳහා ගෙවීම රු 25කි.
- X පැය 8ක දි නිපදවූ ඒකක ගණන 60කි.
- Y පැය 8ක දි නිපදවූ ඒකක ගණන 48කි.

ආයතනයේ සේවකයන් දෙදෙනා සඳහා පැය 8ක දි ගෙවූ වැටුප් පිරිවැය වන්නේ

(1) රු 2 160 කි.
(2) රු 2 200 කි.
(3) රු 2 210 කි.
(4) රු 2 460 කි.
(5) රු 2 500 කි.

**31**. සීමාසහිත සුනිමල් සමාගමේ ණයගැති පාලන ගිණුමෙහි ශේෂය හා පෞද්ගලික ලෙජරයෙහි ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව පහත සැසඳීම් ලේඛනය මගින් ඉදිරිපත් කර ඇත.

| | රු |
|---|---|
| පාලන ගිණුමේ ශේෂය | 650670 |
| දෛනික විකුණුම් පොතෙන් අත්හැරී ඇති ඉන්වොයිසිය | 35 240 |
| | 685 910 |
| පෞද්ගලික ගිණුමකින් අත්හැරී ඇති වට්ටම් | (15 400) |
| පාලන ගිණුමෙහි සටහන් නොවූ බොල්ණය | (7 220) |
| පෞද්ගලික ලෙජරයේ ශේෂ එකතුව | 663 290 |

සීමාසහිත සුනිමල් සමාගමේ ශේෂ පත්‍රයේ වෙළෙඳ ණය ගැතියන් ලෙස දැක්විය යුතු වටිනාකම කුමක් ද?රු ............................

**32**. 2013.03.31 දිනට අන්ගිපා ව්‍යාපාරයේ සංශෝධිත බැංකු ගිණුමේ රු 15 600ක බැර ශේෂයක් පෙන්නුම් කරයි.2013 මාර්තු මාසය වෙනුවෙන් බැංකුවෙන් එවන ලද බැංකු ප්‍රකාශය හා සැසඳීමේදි පහත කරුණු අනාවරණය විය.

**(I)** මාර්තු මාසයේ තැන්පත් කිරීමට යැවූ රු.28 000 ක චෙක්පත්වලින් නිශ්කාශනය වී තිබුණේ රු20 000ක චෙක්පත් පමණි.
**(II)** බැංකුවට සෘජුවම ලැබී ඇති රු 8 000 ක ණයගැති තැන්පතු හා රු 3 000 ක ආයෝජන ආදායම් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන්ව නොමැත.
**(III)** මාර්තු මාසයේ නිකුත් කළ චෙක්පත්වලින් රු 9 400 ක චෙක්පත් 2013.03.31 වන විට මාරු කිරීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නැත.
**(IV)** අයකළ රු 2 000 බැංකු ගාස්තු ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන්ව නැත.

(1)2013.03.01 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ පැවති ශේෂය රු ........................

(2)2013.03.01 දිනට බැංකු ප්‍රකාශනයේ දක්නට ලැබුනු ශේෂය රු ......................

**33**. මුදල් පොත හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් අතර පවත්නා සමානකමක් හා අසමානකමක් ලියන්න.

**(1)**සමානකමක් ..........................................................................................................
..........................................................................................................
**(2)**අසමානකමක්..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

**34**. ගිණුම්කරණ ප්‍රමිත මගින් දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී බලපැවැත්වෙන මූලික උපකල්පන දෙක (02) සඳහන් කරන්න.

**(1)**……………………………………………………………………………………………………

**(2)** ……………………………………………………………………………………………………..

**35**. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පහත සඳහන් දෑ නිර්වචනය කරන්න.

**(I)** වත්කමක ක්ෂය කළ හැකි අගය ……………………………………………………………………..
……………………………………………………………………………..
……………………………………………………………………………

**(II)** වත්කමක සාධාරණ වටිනාකම ...................................................................................................
……………………………………………………………………………
……………………………………………………………………………

**36**. 2013.03.31 දිනෙන් ගිණුම් වර්ෂය අවසන් වන ව්‍යාපාරයක පොලී සම්බන්ධ තොරතුරු පහත වේ.

| | රු |
|---|---|
| 2012.04.01 දිනට උපචිත | 20 000 |
| 2013.03.31 දිනට උපචිත | 30 000 |
| ආදායම් ප්‍රකාශනයේදී අඩුකර ඇති ප්‍රමාණය | 90 000 |

මෙම තොරතුරු අනුව වර්ෂය තුළ මුදලින් කරන ලද පොලී ගෙවීම් කොපමණද? රු …………………………

**37**. හංසලී ව්‍යාපාරයේ පහත සඳහන් තොරතුරු ලබා දී ඇත.

| | (රු) |
|---|---|
| විකුණුම් පිරිවැය | 600 000 |
| අත්පිට විකුණුම් | 450 000 |
| 2013.04.01ට ණයගැති ශේෂය | 45 000 |
| බොල් ණය කපා හැරීම් | 15 000 |
| 10% වට්ටම් අඩු කිරීමෙන් පසු ණයගැති ලැබීම් | 225 000 |

- දළ ලාභ ආන්තිකය විකුණුම්වලින් 20% කි.
- ගිණුම් කාලච්ඡේදය 2013.03.31න් අවසන් වේ.

පහත දෑ ගණනය කර දක්වන්න.

(I) 2013.03.31 දිනට ණයගැතිශේෂය රු ………………..
(II) කාලඡේදයේ දළ ලාභය රු ……………………

**38**.

| | | රු |
|---|---|---|
| සංවිධානයක හිඟ සාමාජික මුදල- | 2012.04.01 දිනට | 9 000 |
| | 2013.03.31 දිනට | 7 200 |
| ඉදිරියට ලද සාමාජික මුදල් | 2013.03.31 දිනට | 6 000 |
| වාර්ෂික සාමාජික ගාස්තු | | 45 000 |

කාලච්ඡේදය තුළදී සාමාජික මුදල් ලෙසට මුදලින් ලැබුණු ප්‍රමාණය කොපමණද? රු………………..

**39**. සීමිත ජගත් සමාගම 2012.01.01 දින කල්බදු ක්‍රමයට සාධාරණ අගය රු 1 200 000 ක් වූ යන්ත්‍රයක් ලබා ගත්තේය.

A. යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වසර 5කි.
B. බදු කාලසීමාව වසර 04කි.
C. මූලික තැන්පතුව රු 200 000කි.
D. ඉතිරි මුදල රු 300 000 බැගින් වාර්ෂික වාරික 4කින් ගෙවිය යුතු අතර පළමු වාරිකය තුළ ඇතුළත් කල්බදු පොලිය රු 80 000 ක් වූ අතර දෙවන වාරිකය තුළ ඇතුළත් වූ පොලිය රු 60 000කි.
E. ජගත් සමාගම සෑම වර්ෂයකම 12.31 දිනට ගිණුම් සකස් කරන අතර මූලික තැන්පතුව හා පළමු වාරිකය ගෙවා ඇත.

(1) ජගත් සමාගම 2012.01.01 දිනට ශේෂ පත්‍රයේ වත්කමක් ලෙස හඳුනාගත යුතු වටිනාකම රු………………
(2) වාර්ෂික ව ක්ෂය කළ යුතු වටිනාකම රු……………………………………………..
(3) 2012.12.31 දිනට ජංගම නොවන වගකීමක් ලෙස දැක්විය යුතු වටිනාකම රු…………………………
(4) 2012.12.31 දිනට ජංගම වගකීම් ලෙස දැක්විය යුතු වටිනාකම රු……………………….

**40**. සමාගමක ගිණුම් වර්ෂය 2013.03.31 දිනෙන් අවසන් වේ. 2013.01.01 දින ලබා ගත් රු 1 200 000ක බැංකු ණයක් සමාන මාසික වාරික 60කින් ආපසු ගෙවිය යුතු ය. සමාගම යම් මාසයකට අදාල වාරිකය ගෙවනු ලබන්නේ ඊළඟ මාසයේ මුල් සතිය තුළදිය. 2013.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මෙම **ණය මුදල** ජංගම හා ජංගම නොවන ලෙස වාර්තා කළ යුතු ආකාරය කුමක්ද?

(I) ජංගම නොවන වගකීම් රු..............................

(II) ජංගම වගකීම් රු ......................................

**41**.සමාගමක් රු 800 000ක ප්‍රතිජ්ඨාවක් ලබා ගැනීම සඳහා වරණීය කොටස් 32 000ක් නිකුත් කරන ලදී. නියමිත අවසාන දිනය වන විට කොටස් 40 000ක් සඳහා අයදුම්පත්‍ර ලැබුනි. සමානුපාතිකව විභජනය කර වැඩිපුර ලද අයදුම්පත්‍ර සඳහා වූ මුදල් ආපසු යවා කොටස් විභජනය කරන ලදී.

ඉහත තොරතුරු වරණීය කොටස් නිකුත් කිරීමේ ගිණුමේ සටහන් කර දක්වන්න.

හර      වරණීය කොටස් නිකුත් කිරීමේ ගිණුම      බැර

| | | | |
|---|---|---|---|
| | | | |

**42**. 2013.04.01 දිනට සීමිත සමාගමක ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් රු 1 000 000 කි. කොටස් ගණන 40 000 ක් වේ.එදින පොදු සංචිතයේ වටිනාකම වූ රු120 000 සම්පූර්ණයෙන් භාවිත කොට රු 25 බැගින් වූ ප්‍රසාද කොටස් නිකුත් කරන ලදී. එදිනට කොටස් 1 200 ක් හිමි රවීචන්ද්‍ර මහතාට හිමිවන ප්‍රසාද කොටස් ගණන කොපමණද? .............................................

**43**.රුපියල් මිලියන 200 ක සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයකින් 2011.04.01 දින ආරම්භ කළ සීමිත නාමවුන්න පොදු සමාගමේ 2011/2012 හා 2012/2013 වර්ෂවල පහත තොරතුරු දක්වා ඇත.(රු මිලියන වලින්)

| | 2011/2012 (රු) | 2012/2013 (රු) |
|---|---|---|
| 3.31 දින මුළු වත්කම් | 280 | 500 |
| මුළු ආදායම | 600 | 880 |
| ආදායම් බදු හැර මුළු වියදම | 640 | 700 |
| ආදායම් බදු | - | 36 |
| ගෙවූ ලාභාංශ | - | 20 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

**(I)** 2012.03.31 දිනට මුළු වගකීම් ...............................

**(II)** 2013.03.31දිනට ස්කන්ධ ප්‍රාග්ධනය ..........................

**44**.කාල පදනම මත වැටුප් ගෙවීමේ වාසි 2ක් සහ නිමැවුම් පදනම මත වැටුප් ගෙවීමේ වාසි 2ක් සඳහන් කරන්න.

කාල පදනම මත

1.............................................................................................................

2.............................................................................................................

නිමැවුම් පදනම මත

1.............................................................................................................

2.............................................................................................................

**45**. සීමිත නැතික් සමාගමේ ගබඩා ලෙජරයෙන් පහත තොරතුරු උපුටාගෙන ඇත.

**ලැබීම්**

| දිනය | ඒකක ප්‍රමාණය | ඒකකයක මිල |
|---|---|---|
| 2013/2/5 | 1400 | රු 10 |
| 2013/2/12 | 500 | රු 12 |
| 2013/2/20 | 1000 | රු 15 |
| 2013/2/25 | 1500 | රු 20 |

| තොග නිකුත් කිරීම් | ඒකක |
|---|---|
| 2013/1/18 | 900 |
| 2013/1/26 | 800 |
| 2013/1/27 | 1000 |

ව්‍යාපාරය ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (FIFO) අනුව තොග නිකුත් කිරීම සිදු කරන විට තොග ලෙජරය පිළියෙළ කරන්නේ නම් 2013.01.27 දිනට තොගයේ වටිනාකම රු.......................................

**46.** පිරිවැය ලාභ පරිමා විශ්ලේෂණයේදී යොදා ගන්නා උපකල්පන දෙකක් දක්වන්න.

..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................

**47.** තනි භාණ්ඩයක් නිපදවන ව්‍යාපාරයක ඒකක 5000 කදී මුළු විකුණුම් වටිනාකම රු 250 000 කි.දායක විකුණුම් අනුපාතය 30% ක් වේ.ඒකකයක විචල්‍ය පිරිවැය කොපමණද?.....................................

**48.** සමාගම් හතරකට පහත තොරතුරු අදාළ වේ.

| සමාගම | ස්ථාවර පිරිවැය (රු) | විකුණුම් ඒකක ගණන | ඒකකයක විචල්‍ය පිරිවැය (රු) | ඒකකයක දායකය (රු) | සමච්ඡේදන ඒකක ගණන | ලාභය/ අලාභය (රු) |
|---|---|---|---|---|---|---|
| E | 5 000 | 1 000 | 5 | (A) | 1 000 | 0 |
| F | 14 000 | 4 000 | 3 | 7 | (B) | 14 000 |
| G | 32 000 | (C) | 6 | 8 | 4 000 | (8 000) |
| H | 21 000 | 10 000 | 4 | 3 | 7 000 | (D) |

ඉහත අක්ෂර වලින් දැක්වෙන වටිනාකම් සඳහන් කරන්න.

(A) ..................
(B) ..................
(C) ..................
(D) ..................

**49.** සීමිත පසන් සමාගම නව යන්ත්‍රයක ආයෝජනය පිළිබඳ සලකා බලයි.

- මිලට ගැනුම් පිරිවැය රු 500 000කි.
- යන්ත්‍රය සවිකිරීමේ පිරිවැය රු 60 000කි.
- ගෙන ඒමේ වියදම රු 40 000කි.
- ඵලදායි ජීව කාලය වසර 5කි.
- පිළිගෙවුම් කාලය සමාන වාර්ෂික වාරිකයන් සහිතව වසර 3ක් යැයි අපේක්ෂිතය.
- ක්ෂය හැර වාර්ෂික මෙහෙයුම් වියදම රු 50 000 ක් යැයි ඇස්තමේන්තු කරයි.

පහත දෑ ගණනය කරන්න.

(1) පළමු වර්ෂයේ ශුද්ධ මුදල් ප්‍රවාහය රු..................................
(2) පළමු වර්ෂයේ ලාභයේ වැඩිවීම රු ................................

**50.** ව්‍යාපාරයක් යන්ත්‍රයක ආයෝජනය කිරීමට අපේක්ෂිත මුදල රු 300 000කි. ආයෝජනයට අදාළ ඇස්තමේන්තු ගත දත්තයන් පහත වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| ශුද්ධ මුදල් ප්‍රවාහය (රු) | 90 000 | 120 000 | 180 000 | 150 000 |
| බදු පසු ශුද්ධ ලාභය (රු) | 40 000 | 60 000 | 80 000 | 60 000 |

(1) යන්ත්‍රයේ ආයෝජනයට ප්‍රතිලාභ අනුපාතය ප්‍රතිශතයක් ලෙසට ...............................
(2) යන්ත්‍රයේ පිළිගෙවුම් කාලය .....................

***